# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - යක්කල

# 2026 වසර සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2026 වසර සඳහා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයට භාණ්ඩ හා සේවා සැපයීම, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ ඉදිකිරීම් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පිළිගත් සැපයුම්කරුවන්ගෙන් / නිෂ්පාදකයින්ගෙන් / දේශීය නියෝජිතයන්ගෙන් / බෙදාහරින්නන්ගෙන් / සිවිල් ඉංජිනේරු කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සෑම ප්‍රධාන කාණ්ඩයක් සඳහා ආපසු නොගෙවන රු.1,000.00 ක තැන්පතු මුදලක් ලියාපදිංචි ගාස්තු ලෙස ගෙවිය යුතුයි.
2. ආපසු නොගෙවන රු. 1,000.00 ක ලියාපදිංචි ගාස්තුව මහජන බැංකුව යක්කල ශාඛාවේ ගිණුම් අංක 333-1001-1-0000059 දරන ගිණුමට ගෙවීම් සිදුකර, එම රිසිට් පත අයදුම්පත් සමග අමුණා එවිය යුතුය. නොඑසේ නම්, සාමාන්‍ය වැඩ කරන දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සරප් වෙත කාර්යාල දිනයන්හිදී මුදලින් ගෙවිය හැක. මුදල් අණකර (Money Order), බැංකු අණකර (Bank Draft) හෝ චෙක්පත් භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.
3. අයදුම්පත් ලබා ගැනීම 2025-11-25 දින සිට 2025-12-16 දක්වා කාලය තුළ, සාමාන්‍ය වැඩ කරන දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරයෙන් හෝ විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය ඔස්සේ බාගත කළ හැකිය. https://gwu.ac.lk/index.php/notices
4. භාණ්ඩ / සේවා / ඉදිකිරීම් කාණ්ඩ සඳහා මුදල් ගෙවූ රිසිට් පත්, සම්පූර්ණ කරන ලද අයදුම්පත්, පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය.
   I. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ක්ෂේත්‍රවලට අදාළ අනෙකුත් බලපත්‍ර පිටපත්
   II. VAT ලියාපදිංචි සහතිකයේ පිටපතක්
5. සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් ලියාපදිංචි නොකරන අතර තැන්පතු මුදල ආපසු නොගෙවන බව කරුණාවෙන් සලකන්න. රජයේ දෙපාර්තමේන්තු / මණ්ඩල / සංස්ථා ඉහත ලිපි ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.
6. මුදල් ගෙවූ රිසිට්පත් ඊට අදාළ සැකසූ අයදුම්පත සමග ලියුම් කවරයක බහා ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026"** ලෙස සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් සහකාර මූල්‍යාධිකාරී (සැපයුම් අංශය) ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයට 2025-12-16 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය හැකිය.
7. ඕනෑම අයදුම්පත්‍රයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. කිසියම් සැපයුම්කරුවෙකු මිල කැඳවීමකට අනුව නියමිත පිරිවිතරයන්ට අනුව නියමිත කාලයට භාණ්ඩ හෝ සේවා ලබාදීමට අසමත් වුවහොත් කලින් දැනුම් දීමකින් තොරව ලියාපදිංචිය අත්හිටුවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. අසම්පූර්ණ අයදුම්පත් හා පෙර වර්ෂවලදී නියමිත පිරිවිතරයන්ට සහ නියමිත කාලයට භාණ්ඩ හෝ සේවා ලබා දීමට අසමත් වූ සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් ලියාපදිංචියෙන් ඉවත් කරනු ලැබේ.
8. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීම් ලබාගන්නා අතර තරගකාරී මිල ගණන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වෙනත් සැපයුම්කරුවන්ගෙන්ද මිල කැඳවීම් කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.
9. ලියාපදිංචි වන සියලුම සැපයුම් හා කොන්ත්‍රාත්කරුවන් දින 30 ක අවම ණය කාලසීමාවකට යටත් විය යුතුය.
10. ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ඒ සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය තොරතුරු පහත සඳහන් දුරකථන අංක හෝ ඊ-මේල් මගින් ලබාගත හැකිය.

දුරකථන අංක : 033-2222740 / 033-2222748 (දිගුව - 113), ඊමේල් : supplies@gwu.ac.lk

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**
**නුවර පාර, යක්කල.**
**2025.11.25**